## Packages:

| Category | Number of Barcodes | Registration Fee (One Time) | Annual Subscription |
|---|---|---|---|
| Category 1 | 100000 | Rs. 20,000/- | Rs. 17,000/- |
| Category 3 | 1000 | Rs. 5,000/- | Rs. 10,000/- |
| Category 4 | 1 | Rs. 2,500/- | - |
| Category 6 | 10 | Rs. 4,000/- | Rs. 6,000/- |


Contact us

**GS1 Lanka**

**The Ceylon Chamber of Commerce**

No. 50, Navam Mawatha, Colombo 02

T +94 (0)11 5588800

D +94 (0)11 5588885

info@gs1lanka.org

www.gs1lanka.org


GS1 Lanka

GS1 Lanka



# GTIN

# GTIN [තීරු සංකේත] යනු මොනවාද?
# GTIN (பார்கோடு) என்றால் என்ன?
# What is a GTIN (Barcode)?

## GTIN (තීරු සංකේත) යනු මොනවාද?

GTIN (Global Trading Item Number) අංකයක් යනු, උපකරණයක් මඟින් කියැවිය හැකි, යම් ආකාරයේ අනුපාතියක් මත තීරු සහ හිඳැස් මාලාවක් සහිතව මුද්‍රණය කරන ලද අංක සහිත සංකේතයකි. ලේසර් හෝ කැමරා පාදක කොටගත් පද්ධති හරහා ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සුපරීක්ෂා කිරීම සිදු කළ හැකි එය, ඊට සම්බන්ධ විස්තරාත්මක දත්ත සහ වෙනත් වැදගත් තොරතුරු ඇතුලත් වාර්තාවක් පද්ධතියක් තුළින් සොයා ගැනීමට උපකාරී වේ.

## GTIN (තීරු සංකේත) භාවිතා කිරීමේ වාසි

- **මිනිසෙකු අතින් සිදු විය හැකි වැරදි මග හරවා ගැනීම:** මිනිසෙකු අතින් සිදු විය හැකි වැරදි මග හරවා ගැනීම තීරු සංකේත තාක්ෂණයේ ආධාරයෙන් සිදු කළ හැකි අතර, එමගින් ආයතනයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු වේ.
- **ලේබණගත භාණ්ඩ පාලනය කිරීමේ ස්වයංක්‍රීය පද්ධතියක හැකියාව ලබා දේ:** ලේබණගත භාණ්ඩවලට තීරු සංකේත යොදා ඇති නිසා, භාණ්ඩ ලේබණගත කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණක ආධාරයෙන් සිදු කළ හැක.
- **තීරු සංකේත මගින් කාලය සහ වියදම ඉතිරි කරගත හැක:** තීරු සංකේත සහිත ලේබණගත භාණ්ඩ තිබීම මගින් අඩු සේවක සංඛ්‍යාවක් යොදවා සීමිත කාලයක් තුලදී, සැලකිය යුතු වියදම් සහ කාලය ඉතිරි කිරීමක් සමග සේවා ලබා දිය හැක.
- **මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවාගත හැක:** වඩාත් වේගවත් හා නිවැරදි වාර්තා පවත්වා ගැනීම තීරු සංකේත මගින් සහතික කෙරෙන නිසා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කර දිය හැක.

## Global Standards 1 (GS1) යනු කුමක්ද?

GS1 යනු, දේශීය සහ ජාත්‍යන්තර පරදු දරන්නනන් සමග කටයුතු කිරීමේදී ව්‍යාපාර භාවිතා කරන ගෝලීය භාෂාව වේ.

ව්‍යාපාරයකට තීරණාත්මක වන ව්‍යාපාර අතර තොරතුරු හඳුනා ගැනීම, ග්‍රහණය කර ගැනීම හා බෙදා හදා ගැනීමට GS1 උපකාරී වේ.

මිල දාම කටයුතු සිදු කිරීමේදී සිදු වන වෙනස්කම් මගින් සමාගම් එකිනෙකාට අසමසම වන අතර, මෙම වෙනස්කම් නිසා සමාගම් අතර හටගත හැකි ව්‍යාකුලත්වයන් මග හරවා ගැනීමට GS1 භාවිතා කෙරේ. මේ වන විට, සැපයුම් දාමයේ සිටින සිල්ලර වෙළෙඳුන්, නිෂ්පාදකයින්, ප්‍රවාහන පහසුකම් සපයන්නන් සහ රෝහල්වලට අවම වියදමක් දරා සැපයුම් දාමයේ ඕනෑම අවස්ථාවකදී නිෂ්පාදන අධීක්ෂණය සිදු කිරීම හා වෙනස් වන පාරිභෝගික ඉල්ලුම අවබෝධ කර ගැනීමට තීරු සංකේත ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

## GS1 සමග එක් වීමේ වැදගත්කම:

- **නිෂ්පාදන ජාත්‍යන්තර වශයෙන් හඳුනා ගැනීමේ හැකියාව:** එක් රටකදී නිෂ්පාදනයකට ලැබෙන තීරු සංකේතය මගින් එය අන් ඕනෑම රටකදී වෙන් කොට හඳුනා ගත හැක. එමගින්, ඔබගේ නිෂ්පාදන ලොව ඕනෑම ස්ථානයකදී පහසුවෙන් හඳුනාගත හැකි වේ.
- **ඔබගේ නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතික:** ඔබගේ නිෂ්පාදනයේ සඳහන්ව තිබෙන GS1 මගින් එම නිෂ්පාදන ලෝක සම්මත ප්‍රමිතීන්වලට අනුකූල බවට වන සහතිකය ලබා දේ.
- **ඔබගේ නිෂ්පාදන ජාත්‍යන්තරව තරඟකාරී වේ:** අපනයනකරුවන් තම නිෂ්පාදන තීරු සංකේතගත කිරීම ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය වැනි රටවල අනිවාර්ය වන අතර, ඔබගේ නිෂ්පාදන තීරු සංකේතගත කර ගැනීමෙන් අනෙක් අපනයනකරුවන්ට වඩා ඔබට තරඟකාරී වාසියක් අත් වේ.

## GS1 Lanka

ශ්‍රී ලංකාවේ GS1 සැපයුම් දාම ප්‍රමිති පද්ධතිය ක්‍රියාවට නැංවීම සඳහා සිටින එකම බලය ලත් ආයතනය වන්නේ GS1 Lanka ය. ශ්‍රී ලාංකික සමාගම් සඳහා ජාත්‍යන්තර තීරු සංකේත නිකුත් කිරීම සහ ශ්‍රී ලංකා GS1 නිෂ්පාදන අංක බැංකුව පවත්වාගෙන යෑම අපි සිදු කරන්නෙමු. ජාත්‍යන්තර GS1 ප්‍රමිති පද්ධතිය භාවිතා කිරීම හරහා උපරිම ප්‍රතිලාභ අත් කර ගැනීමට අවශ්‍ය වන උපකාර සහ සහාය අවශ්‍ය සෑම අවස්ථාවකදීම අපගේ සාමාජිකයින්ට ලබා දෙන බවට අපි සහතික වෙමු. ශ්‍රී ලංකාවේ අන් කිසිදු ආයතනයක් මගින් තීරු සංකේත නිකුත් කිරීම හෝ එවැනි තීරු සංකේත භාවිතා කිරීම හෝ නීති විරෝධී වන අතර එවැන්නන්ට එරෙහිව නීතිමය පියවර ගනු ලැබේ.

## ඔබ තීරු සංකේත මිල දී ගන්නේ කෙසේද?

පැය භාගයක් වැනි ඉතා අඩු කාලයක් තුලදී සරල පටිපාටියක් හරහා ඔබගේ තීරු සංකේත ලබා ගැනීමේ හැකියාව ඔබ සතුව පවතී. අදාළ අයදුම්පත ලබා ගැනීම සඳහා අප අමතන්න.

## අවශ්‍යතා:

1. ආයතනය වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කිරීම සඳහා බලය ලත් එක් පුද්ගලයෙකු ඉදිරිපත් වීම (එක් අයෙකු පමණක් හිමිකාරීත්වය/සහකාරත්වය දරන්නේ නම් එම හිමිකරුවා)
2. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ මුල් සහතිකය සහ එහි අනුපිටපතක් (අනිවාර්යයි)
3. අධ්‍යක්ෂවරයා පිළිබඳ විස්තර - මුල් ආකෘති පත්‍ර අංක 1 හෝ අංක 20 සහ එහි අනුපිටපතක් (රබර් මුද්‍රාව අනිවාර්යයි)
4. බිල්පත් සාක්ෂිය - දුරකථන බිල හෝ විදුලි බිල වැනි
5. අංක වහාම නිකුත් කිරීම සඳහා මුදල් මගින් ගෙවීම සිදු කිරීම හෝ 'ලංකා වාණිජ මණ්ඩලය' නමට චෙක් පත් හරහා ගෙවීම සිදු කිරීම කළ හැක. චෙක් පත් හරහා කරන ගෙවීමකට අංක නිකුත් කිරීම සඳහා වැඩ කරන දින හතරත් පහත් අතර කාලයක් ගත වේ.

## පැකේජ:

| කාණ්ඩය | තීරු සංකේත සංඛ්‍යාව | ලියාපදිංචි වීමේ ගාස්තුව (එක් වරක් පමණක් ගෙවන) | වාර්ෂික දායක මුදල |
|---|---|---|---|
| 1 වැනි කාණ්ඩය | 100000 | රු. 20,000 | රු. 17,000 |
| 3 වැනි කාණ්ඩය | 1000 | රු. 5,000 | රු. 10,000 |
| 4 වැනි කාණ්ඩය | 1 | රු. 2,500 | - |
| 6 වැනි කාණ්ඩය | 10 | රු. 4,000 | රු. 6,000 |


අප අමතන්න

**GS1 Lanka**

**ලංකා වාණිජ මණ්ඩලය**

අංක. 50, නවම් මාවත, කොළඹ 02.

T +94 (0)11 5588800 D +94 (0)11 5588885

info@gs1lanka.org

www.gs1lanka.org